// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2387/36 - 2024 ජුනි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2024.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ 1990 අංක 03 දරන නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයයි**

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ 1990 අංක 03 දරන නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම සම්බන්ධ ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ පිරිනැමී ඇති බලතල ප්‍රකාරව පහත රෙගුලාසි මෙයින් පනවනු ලබන බව නිවේදනය කරමි.

තවද 2024 අංක 02 දරන ඉහත කී රෙගුලාසි 2024 ජුනි 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි බලපැවැත්විය යුතු බව ද මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී, පීඑච්ඩී(ගෞරව)
එෆ්.අයි.එම් (ශ්‍රී ලංකා) එන්ඩීසී, පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2024 ක් වූ මැයි මස 29 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 6746 — 44 (2024/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රෙගුලාසි**

01. මෙම රෙගුලාසි 2024 අංක 02 දරන බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ආධාර ලබාදීමේ රෙගුලාසි යනුවෙන් හැඳින්වේ.

02. බස්නාහිර පළාත් නිවාස සංවර්ධන අරමුදල මගින් අඩු ආදායම්ලාභි පවුල් සඳහා ලබාදෙනු ලබන නිවාස ආධාර පහත සඳහන් කාණ්ඩ යටතේ ඊට අනුරූපී වටිනාකම් යටතේ විය යුතුය.

| *කාණ්ඩය* | *වටිනාකම* |
|---|---|
| 01. 5'අ'(1). නිවසක් අලුතින් ඉදිකිරීම.<br>මේ සඳහා ආධාරලාභියෙකුට ගෙවන උපරිම ආධාර මුදල (වාරික ගණන 2කි.)<br>(i) වැඩ ආරම්භ කිරීමට සූදානම් කළ විට - රු. 150,000.00<br>(ii) කොටසක් අවසන් කළ නිවසේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීම සඳහා - රු. 150,000.00 | රු. 300,000.00 |
| 02. 5'අ'(2). තිබෙන නිවස වැඩිදියුණු කිරීම හා කොටසක් නිමකර ඇති නිවස සම්පූර්ණ කිරීම සඳහා (වාරික ගණන 2කි.)<br>(i) වැඩ ආරම්භ කිරීමට සූදානම් කළ විට - රු. 100,000.00<br>(ii) නියමිත වැඩ කොටස අඩක් නිම කළ විට - රු. 100,000.00 | රු. 200,000.00 |

03. සෑම විට ම නිවාස සංවර්ධන අරමුදලේ රුපියල් මිලියන හැටක අවම ශේෂයක් පවත්වා ගෙන යමින් මෙම රෙගුලාසි යටතේ නිවාස ආධාර ලබාදීම සිදු කළ යුතුය.

04. මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දින සිට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2318/51 හා 2023 පෙබරවාරි 10 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් බස්නාහිර පළාත් අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ආධාර ලබාදීමට අදාළ රෙගුලාසි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

05. මෙම රෙගුලාසි යටතේ "අඩු ආදායම්ලාභී" යන්නට මාසිකව රුපියල් පහළොස්දහසක උපරිම ආදායමක් නොඉක්මවන ආදායම් ලබන අයෙකු අදහස් වේ.

06. මෙම රෙගුලාසිවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

EOG 06 - 0043

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.